# දේවදත්ත න්‍යාය

කපිල පීරිස් මහතා නොවැම්බර් 4 වැනි දා ලිපියෙන් සීමාව, විරුද්ධාභාස සහ මැක්කාගේ න්‍යාය ගැන කතා කරයි. ඔහු කියන්නේ ඔහුගේ ඇතැම් ලිපිවලට ලැබෙන ඇතැම් ප්‍රතිචාර ගැන ඔහු යමක් සඳහන් කළ යුතු බව ය. එහෙත් මේ ප්‍රතිචාර විද්‍යුත් හරහා නොවේ යැයි ද ඒ මහතා කියයි. මේ ප්‍රතිචාර දැක්වූයේ කවු දැයි මම නො දනිමි. ඒ කෙසේ වෙතත් විද්‍යුත් මගින් නොලද ප්‍රතිචාර ඒ කුමක් දැයි විස්තර නොකර විද්‍යුතරෙහි පිළිතුරු දෙන්නේ කුමකට ද? ඔහු විසින් කළ යුතුව තිබුණේ ඒ ප්‍රතිචාර දැක්වූ අයට ඒ මාර්ග ඔස්සේ ම පිළිතුරු දීම මිස ඒ සඳහා විද්‍යුත් උපයෝගී කර ගැනීම නො වේ. විද්‍යුත් මගින් නැගෙන කිසිම ප්‍රතිචාරයකට ඔහු පිළිතුරු නොදී එක් එක් දින වෙනත් කරුණු අළුතින් ගෙන එයි.

ඒ මහතාගේ සීමාව, විරුද්ධාභාස, ස්ථිති ගති විද්‍යාව පමණක් නොව උඩු ගුවනේ සිදුකළ විවාහය ගැන ද මට කීමට ඇත්තේ එක් කරුණක් පමණකි. ඒ ලිපිවල වැරදි ඇතත් මා ඒ සියල්ලට ප්‍රතිචාර නොදක්වන බව මා කලින් ද කියා ඇත. බටහිර ගණිතය හා බටහිර විද්‍යාව පිළිබඳ ව විද්‍යුත් පුවත්පතෙහි පළවන සියළු වැරදි කරුණු ගැන සඳහන් කිරීම මගේ ප්‍රතිපත්තිය නො වේ. මා ප්‍රතිචාර දක්වන්නේ අපේ ප්‍රවාද හා සම්බන්ධ පදනමට එරෙහිවූ කරුණුවලට ය. කපිල පීරිස් මහතා මගේ ප්‍රතිචාර සැලකිල්ලෙන් කියවී නම් ඒ කරුණ අවබෝධ කරගනු ඇත. කපිල පීරිස් මහතාට බටහිර ගණිතය හා බටහිර විද්‍යාව පිළිබඳ පැහැදිලි අවබෝධයක් නැති බව නම් කිව යුතු ය. එහෙත් මේ කියන මැක්කාගේ න්‍යාය මෙහි දී අදාළවන්නේ කෙසේදැයි ඒ මහතා පැහැදිලි කර තිබිණි නම් මැනවි.

අපේ ඉංජිනේරු සම්ප්‍රදාය පිළිබඳ ලිපිවලින් කියන්නේ කුමක් ද යන්න පිළිබඳ ඒ මහතා මුණගැසෙන කිහිප දෙනාට ගැටලුවක් නැතිවන්නට හැකි ය. එහෙත් අපට නම් එහි පරස්පර වෙයි. අප ඒ මහතාගේ ලිපිවල ඇති පරස්පර පෙන්වා ඒවාට පහර දෙනවා වෙනුවට ඒ පැහැදිලි කරන ලෙස පැවසිය යුතුව තිබිණි යැයි ඒ මහතා කියයි. කපිල පීරිස් මහතාට තේරුම්ගැනීම හා පරස්පර දැකීම අතර වෙනස ගැන ද අවබෝධයක් නැත. පරස්පරවලින් තොරව ලියූ ලිපියක් වුව ද ඇතැම් විට තේරුම් ගැනීමට නොහැකි විය හැකි ය. එයට විවිධ හේතු තිබිය හැකි ය. ලිපිය ලියන්නාගේ ශෛලිය, කියවන්නාට ඒ ලිපිය තේරුම් ගැනීමට අවශ්‍ය දැනුම හෝ බුද්ධිය හෝ ඒ දෙකම හෝ නොමැතිවීම ආදිය එයට හේතුවිය හැකි ය. එහෙත් පරස්පර සහිත ලිපියක පරස්පර ඇති බව තේරුම් ගත හැකි ය. එපමණක් නො වේ. ලිපිය ලියා ඇති තැනැත්තාට තමා කියන දේ පිළිබඳ අවබෝධයක් නැති බව ද ඔහු අතනින් මෙතනින් අහුලාගත් කරුණු කිසිදු සංගතබවකින් තොරව කියන බව ද සිහි බුද්ධියෙන් ලිපිය කියවන අයකුට තේරුම් ගත හැකි ය. කපිල පීරිස් මහතාට තම ඊනියා ඉංජිනේරු සම්ප්‍රදාය ගැන කිසිදු අවබෝධයක් නැත. ඒ මහතා ඉතා පැහැදිලිව ම තම ඊනියා ඉංජිනේරු සම්ප්‍රදාය හා අපේ ජීවන රටාව පටලවා ගනියි. කෙසේ වෙතත් ඒ මහතා අපේ විවේචනයට පසුව හෝ තමන්ට අවශ්‍ය වූ දේ පැහැදිලි නොකළේ ඇයි? අප පෙන්වූ පරස්පරවල පරස්පරයක් නොමැති බව පෙන්වා ඒ කරුණු තව තවත් පැහැදිලි කිරීමට ඒ මහතාට අවකාශය තිබිණි.

අප ඒ මහතාගෙන් ඒ පැහැදිලි කරන ලෙස ඉල්ලා නොසිටියේ ද ඔහු ඒ පැහැදිලි නො කෙළේ ද එකම එක කරුණක් නිසා ය. ඔහුට ඒ පැහැදිලි කිරීමට නො හැකි ය. තමන් කියන්නේ කුමක් ද යන්න තමන්ට ද පැහැදිලි නැති කළ අන් අයට ඒ පැහැදිලි කරන්නේ කෙසේ ද? ඒ මහතාට කළ හැක්කේ තව තවත් පරස්පරවල ගිලීම පමණ ය. එහෙත් ඒ සියල්ලෙහි දී ඒ මහතා ගැලවීමට කියන කරුණක් වෙයි. එනම් අප බටහිර න්‍යායට අනුව කටයුතු කරමින් ඒ මහතා විවේචනය කරන බව ය. ඒ නම් හොඳ ගැලවිජ්ජාවකි. මේ දේවදත්ත න්‍යාය ය. දේවදත්ත පෙන්වීමට තැත් කෙළේ තමන් බුදුන්වහන්සේට ද වඩා බුදු දහම දන්නා බව ය.

මෙයින් මා බුදුන්වහන්සේ සමග සංසන්දනය කිරීමට උත්සාහ නොගන්නා බව පැහැදිලි විය යුතු ය. බටහිර ද්විකෝටිකයෙහි ඇති ප්‍රශ්න බටහිර දැනුම නිර්මාණය වන්නේ කිනම් පදනමක ද ආදිය ගැන පළමුවෙන් කතා කෙළේ මා ය. එහෙත් ගුරුන්ටත් (කපිල පීරිස් මහතාගේ ගුරු යන අරුතින් නො වේ) අකුරු වැරදිය හැකි ය. එහෙත් ද්විකෝටිකය යොදාගත හැක්කේ කිනම් අවස්ථාවන්හි ද යොදාගත නොහැක්කේ කිනම් අවස්ථාවන්හි ද යන්න පිළිබඳ ව දැනුමක් මට ඇතැයි මම සිතමි. බොහෝ දෙනාට ඇතැම්විට අමතක වන කරුණක් නම් චතුස්කෝටිකයෙහි ද්විකෝටිකය ද ඇතුළත් බව ය.

© Prof. Nalin De Silva

කපිල පීරිස් මහතා නොවැම්බර 4 වැනි දා ලිපියෙන් මෙසේ කියයි. “ මා ඉංජිනේරු සම්ප්‍රදාය (හා නිව්ටන්) පිළිබඳ ලියා ඇත්තේ බටහිර න්‍යායට ගැලපෙන පරිදි ප්‍රස්තුත A, B ලෙස නම් කර, ඒවායින් අදාළ නිගමන ඒ තරක ඔස්සේ ලැබෙන ආකාරය පෙන්වමින් නො වේ. එසේ ම එක් වාක්‍යයකින් කියැවෙන දේ පැහැදිලි කිරීමටත් වරහන් තුළ තවත් දෑ එතරම් ලියා නැත. සන්දර්භය තුළ ඒවා තේරුම්ගත යුතු ය. දැන් ඒ මහතා (නලින් ද සිල්වා) කේන්ද්‍රීය ප්‍රශ්නයෙන් මුළුමනින් ම පිටපැන බටහිර න්‍යායට අනුව සිංහල වාක්‍ය ලිවීමට මා හට ඇති නොහැකියාව පෙන්වීමේ ව්‍යායාමයක නිරත වෙයි. එහි දී මා අදක්‍ෂ වනවා විය හැකි ය. එය මෙහි දී වැදගත් නැත.’’

කපිල පීරිස් මහතාට ව්‍යාකරණානුකූලව සිංහල වාක්‍ය ලිවිය හැකි ය. ඒ පිළිබඳ කිසිදු ගැටළුවක් නැත. බොහෝ විට ඒ මහතා හෙළ හවුලේ පද බෙදීම ද අනුගමනය කරන බව පෙනෙයි. ප්‍රශ්නය ඔහුගේ සිංහල නො වේ. ඔහුට ඉතා හොඳින් වාක්‍ය ලිවීමට හැකි වුවත් මෙහි දී වාක්‍ය කිහිපයක් සංගත ව ලිවීමට නො හැකි බව පෙන්වා ඇත. අප මෙහි දී කතාකරන්නේ ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප ගැන නො වේ. එසේත් නොමැති නම් වෙනත් හේතුවක් නිසා ද්විකෝටිකයෙන් තේරුම් ගැනීමට නොහැකි සංකල්ප ගැන නො වේ. කපිල පීරිස් මහතාට සංගතව වාක්‍ය ලියා ගත නොහැක්කේ ඔහු අවුලක පැටලී ඇති බැවින් ය. ඔහු කේන්ද්‍රික ප්‍රශ්නය යැයි කියන දේ ගැන කතාකිරීමට පෙර මේ පරස්පර (විරුද්ධාභාස නොවන බව ද මෙහි දී සඳහන් කළ යුතු ය. පරස්පර හා විරුද්ධාභාස යන්න අප යොදාගන්නේ බටහිර අර්ථයකිනි. එයට හේතුව ඒ ගැන ඉගැන්වෙන්නේ එහි බැවිනි. එහි පරස්පර - පරස්පර විරෝධය - විසංවාද- contradictions හා විරුද්ධාභාස - paradoxes යනු දෙකක් මිස එකක් නො වේ.) කවරේදැයි පෙන්වීමට අවශ්‍ය විය.

සන්දර්භයෙන් යමක් තේරුම් ගත හැක්කේ ද පරස්පර නැතිනම් පමණකි. පරස්පරවලින් ගහණ ලිපියක අප සැලකිය යුතු සන්දර්භය කුමක් ද? ප්‍රස්තුත පිළිවෙළින් ලියා අදාළ නිගමන තරකයෙන් ලබාගැනීම බටහිර න්‍යායක් පමණක් නො වේ. ග්‍රීකයන් ඒ ක්‍රමය වර්ධනය කළ බව සැබෑ ය. එහෙත් දුක, දුකට හේතුව, දුක නැතිකිරීම (නිවන), නිවනට මග යනුවෙන් කියැවෙන විට ද ඒ ක්‍රමය භාවිතා වෙයි. ද්විකෝටිකය යොදාගත යුතු තැන ඒ යොදාගත යුතු ය. එහි දී පරස්පරවලින් තොරව ද්විකෝටිකයට අනුව සංගත ව කරුණු ඉදිරිපත් කළ යුතු ය. මිහිඳු මහා රහතන් වහන්සේ දේවානම්පිය තිස්ස රජුගෙන් ඇසූ පළමු ප්‍රශ්න මාලාවට පිළිතුරු ඇත්තේ ද්විකෝටිකයෙහි ය. එහි දී ද්විකෝටිකයෙහි පරස්පරයක් අපට හමු නො වේ. උන්වහන්සේ රජුගෙන් ඇසූ දෙවැනි ප්‍රශ්න මාලාවෙහි පිළිතුර චතුස්කෝටිකයට අදාළ ය. ද්විකෝටිකයට අනුව නම් රජු එක්කෝ තමාගේ නෑයකු විය යුතු ය. නැත්නම් නොනෑයකු විය යුතු ය. කපිල පීරිස් මහතා දේවදත්ත න්‍යායේ හිඳිමින් කියන්නේ පළමු ප්‍රශ්න මාලාව ද ද්විකෝටිකයෙන් තේරුම් නොගත යුතු බව ය. ඔහුට අනුව අප සෑම විට ම චතුස්කෝටිකය යොදා ගත යුතු ය. එහෙත් චතුස්කෝටිකයට අනුව වුවත් ඔහු ලියා ඇති කිසිවක් නැත. ඔහු කරුණු ඉදිරිපත් කරන්නේ ද්විකෝටිකයෙහි ය. ඔහුට වැරදුණු විට ඔහු ඊනියා සංදර්භයක් ගැන කියමින් පළා යයි. කපිල පීරිස් මහතා දන්නා චතුස්කෝටිකයක්වත් ද්විකෝටිකයක්වත් නැත. ඔහු තම වාසියට කබරගොයා තළගොයා බවට පත්කරන වංචනිකයකු පමණ ය.

තලගොයා කබරගොයා කිරීම යන්න ම සලකා බලමු. සිංහල සංස්කෘතියෙහි ඇති මේ කියමන ද්විකෝටිකයෙන් ලැබෙන්නකි. තලගොයා තලගොයා ලෙසත් කබරගොයා කබරගොයා ලෙසත් හැඳිනගත යුතු බව ඉන් කියැවෙයි. තලගොයා කබරගොයා කළ නොහැකි බව ද ඉන් ගම්‍ය වෙයි. කපිල පීරිස් මහතාගේ ක්‍රමය අනුව නම් මෙය ද්විකෝටිකය අත්හැර චතුස්කෝටිකයෙහි ඉතිරි අවස්ථා දෙකෙන් කිවයුතු වෙයි. ඒ කබරගොයාත් නොවේ ය තලගොයාත් නොවේය නැත්නම් කබරගොයාත් තලගොයාත් එකම යනුවෙන් ඒ සංශෝධනය කිරීමට ඒ මහතා කටයුතු කරනු ඇත. අපේ සංස්කෘතියෙහි ගෑවී නොගෑවී වැනි කියුම් චතුස්කෝටිකයෙහි ඉතිරි අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් නිර්මාණය වී ඇත. එහෙත් චතුස්කෝටිකයෙහි ම අන්තරගත වූ ද්විකෝටිකය සෑම විටක ම අත්හැරිය යුතු බවක් අපේ සංස්කෘතියෙහි නොකියැවෙන බව අමතක නොකළ යුතු ය.

අපි පසුගිය සතියෙහි කපිල පීරිස් මහතාගේ ඊනියා කේන්ද්‍රීය ප්‍රශ්නයට පිළිතුරු දීම ඇරඹුයෙමු. එහෙත් ඒ තවදුරටත් විස්තර කිරීමට පළමු මිරිසවැටිය කඩාවැටීම පිළිබඳ කරුණක් කිව යුතු ය. මිරිසවැටිය කඩාවැටුණේ කුලසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් ඒ ප්‍රතිසංස්කරණය කිරීමට යෑමේ දී ය. එහි දී කුලසිංහ මහතාට පහරගැසීම සඳහා එක්තරා පුද්ගලයකු විවිධ කරුණු කියා ඇත. එහෙත් කපිල පීරිස් මහතා බෙහෙවින් අගය කරන ඩී එල් ඕ මැන්දිස් මහතා

© Prof. Nalin De Silva

කුලසිංහ මහතා වෙනුවෙන් පෙනී සිට ඇත්තේ පිළිසකර කටයුතු කිනම් ඉංජිනේරු සම්ප්‍රදායක කෙරිණි ද යන්න සොයා නො බලමිනි. රුවන්වැලි සෑය එයට බොහෝ කලකට පෙර ප්‍රතිසංස්කරණය කෙරුණේ ඒ පැරණි ඉංජිනේරු සම්ප්‍රදායක් ගැන සොයා බැලීමෙන් පසුව නොවන බව නැවතත් අවධාරණය කළ යුතු ය.

වරහන් ඇතුළත ලිවීම ගැන ද කපිල පීරිස් මහතා සඳහන් කරන්නේ තමන් ඒ කරන්නේ ඉතා අඩුවෙන් බව කියමිනි. මා ඇතැම් විට වරහන් තුළ යම් යම් දේ කියන බව සැබෑ ය. මා වරහන් ගත්තේ බටහිර සම්ප්‍රදායෙන් බව සැබෑ ය. අප කවුරුත් යොදා ගන්නා කොමාව ආදී විරාම ලකුණු ද අප ලබාගෙන ඇත්තේ බටහිරින් ය. එහි වරදක් නැත. වෙනත් සංස්කෘතියකින් අවශෝෂණය කිරීම තහනම් කෙරී නැත. වරහන් තුළ ඇතැම් දේ විස්තර කෙරෙන්නේ නම් බටහිර ක්‍රමයකට නොවන බව කිව යුතු ය. ඇතැමුන් සම්බන්ධයෙන් විස්තර කළ යුතු යමක් කරුණු හලා යෑමට බාධාවක් නොවන අයුරින් පැහැදිලි කිරීම වරහන් තුළ යමක් ලිවීමෙන් කෙරෙයි. අපේ හාමුදුරුවරු ධර්ම දේශනාකිරීමේ දී මේ ක්‍රමය අනුගමනය කරති. යම් කරුණක් දේශනා කර ඒ කියන්නෙ යනුවෙන් විස්තර කරන්නේ ඒ ක්‍රමයට ය. කතාකිරීමේ දී වරහන් නොයොදන බැවින් එහි ඇති වරහන බොහෝ දෙනාට ගෝචර නො වේ.

මා අනවශ්‍ය අන්දමින් දෙමළ ජාතිවාදී ගැටලුව සහ ඉංජිනේරු සම්ප්‍රදාය ගැටලුව සසඳමින් සිටී යැයි කපිල පීරිස් මහතා කියන්නේ කිනම් සදාචාරයකට අනුව ද? දෙමළ ත්‍රස්තවාදය පරාජය කිරීමේ දී අප කළ දෑ තමාගේ ඊනියා ඉංජිනේරු සම්ප්‍රදාය පිළිබඳ ව්‍යාපෘතිය සමග සංසන්දනය කෙළේ කපිල පීරිස් මහතා ය. ඔහු ඒ වැරදියට සංසන්දනය කළ බැවින් ඒ නිවැරදි කිරීමේ අවශ්‍යතාව විය. අප එසේ නිවැරදි කරන විට එයට ප්‍රතිචාර නොදක්වන කපිල පීරිස් මහතා අනවශ්‍ය සංසන්දනයක් ගැන කියයි. කපිල පිරිස් මහතා සතිපතා වැරදි කරුණු අලුතින් එකතු කරමින් විවාදය දික් නොකරන්නට අපට එවැනි දෑට පිළිතුරු දීමේ අවශ්‍යතාවක් පැන නොනැගීමට තිබිණි. කපිල පිරිස් මහතා ගෙනෙන හැම කරුණක් ම බිඳ වැටී ඇත. අපට ඒ සඳහා ලිපි හා කාලය මිඩංගු කිරීමට සිදු වූ බැවින් ඊනියා කේන්ද්‍රීය ප්‍රශ්නයට පිළිතුරු දීම කල් දැමීමට සිදුවිණි. අවාසනාවකට මේ සතියේ ද එයට ඉඩක් නො ලැබෙයි. එහෙත් ඉතා කෙටියෙන් අපට කීමට ඇත්තේ මෙයයි. කපිල පීරිස් මහතා දන්නා අපේ ඊනියා ඉංජිනේරු සම්ප්‍රදායක් නැත. බයිසිකලය කෙසේවත් අපේ ඉංජිනේරු සම්ප්‍රදායක බිහිවූවක් නො වේ. අපේ ඉංජිනේරු සම්ප්‍රදාය එකකි. අපේ ජීවන රටාව තවත් එකකි. ඒ දෙක අතර සම්බන්ධයක් ඇත. එහෙත් කපිල පීරිස් මහතා කරන්නාක් මෙන් ඒ දෙක පටලවා ගත යුතු නො වේ. නිව්ටන්ගේ ලෝකයෙන් නිව්ටන්ගේ නියම වෙන්කළ හැකි නොවන අතර නිව්ටන්ගේ සංකල්ප හා ප්‍රවාද ඔස්සේ අපේ ඉංජිනේරු සම්ප්‍රදායක් සොයාගත නොහැකි ය. බටහිර සංවර්ධන රැල්ල පරාජය කිරීමට නිව්ටන් ම යොදාගැනීම හොරාගෙ අම්මගෙන් පේන ඇසීමක් වැනි ය. අප කළ යුත්තේ අමාරුවෙන් වුව ද අපේ ප්‍රවාද වෙනත් ක්ෂේත්‍රවල මෙන් ම ඉංජිනේරු ක්ෂේත්‍රයෙහි ද නිර්මාණය කිරීම ය. අපේ ප්‍රවාද නිර්මාණය කිරීමට පෙර ලෝකය විනාශ වන්නේ නම් අප කම්පා විය යුතු නො වේ. කපිල පීරිස් මහතාට කිසි දිනෙක නිව්ටන් ඔස්සේ අපේ ඉංජිනේරු සම්ප්‍රදාය දැනගත නොහැකි වනු පමණක් නොව ඔහු තම ව්‍යාපෘතිය ඔස්සේ ලෝක විනාශය ඉක්මන් කිරීමට සුළුවෙන් වුවත් දායක වනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva